මගේ බිය තුරන් කරනු මැනව. මගේ ඉදිරිපස, පසුපස, දකුණු පස, වම්පස, ඉහළ හා පහළ යන දිශාවන්වන් ගෙන් ආරක්ෂාව සලසනු මැනව. ඔබේ ශ්‍රේෂ්ඨත්වයේ නාමයෙන් මට පහලින් විය හැකි අනතුරුවලින් මම ආරක්ෂාව පතමි.

«اللهم أنت ربي لا إله إلا أنت. خلقتني وأنـــا عبدك. وأنا على عهدك ووعدك ما استطعت. أعوذ بك من شر ما صنعت. أبوء لك بنعمتك علي. وأبوء بذنبي. فاغفر لي. فإنه لا يغفر الذنوب إلا أنت»

"අල්ලාහුම්ම අන්ත රබ්බී ලා ඉලාහ ඉල්ලා අන්ත හැලක්තනී වඅන අබ්දුක වඅන අලා අහ්දික වඅදික මස්තතෑතු, අඋදු බික මින් ෂර්රි මා සනෑතු, අබූඋ ලක බිනිඃමතික අලෙයිය, වඅබූඋ බිදන්බී ෆග්ෆිර්ලි ෆඉන්නහූ ලා යග්ෆිරුද් දුනූබ ඉල්ලා අන්ත." තේරුම: අහෝ දෙවිඳුනි! මගේ පරමාධිපති ඔබය. නැමදුමට සුදුස්සා ඔබ හැර අන් කිසිවෙකු නැත. ඔබ මාව මැව්වේය. මා ඔබේ වහලාය. මට හැකි පමණින් ඔබ හා වුණු ගිවිසුම හා පොරොන්දුව ඉටු කරමි. මම කළ දැහි හානියෙන් ආරක්ෂාව ඔබෙන් පතමි. ඔබ මට ලබාදුන් දායාදයන් මගින් ඔබ වෙතට මා නැඹුරු වෙමි. තවද මා කළ පාපයන් මම පිළිගනිමි. එනිසා මට සමාව දෙනු මැනව. නියත වශයෙන්ම ඔබ හැර පාපයන්ට සමාව දීමට වෙනත් කිසිවකු නැත.

«اللهم فاطر الســـماوات والأرض. عالم الغيب والشهادة. ربّ كل شيء ومَليكه. أشهد أن لا إله إلا أنت. أعوذ بك من شر نفسي ومن شر الشـــيطان وشركه وأن أقترف على نفسي سوءاً أو أجُرّه إلى مسلم»

"අල්ලාහුම්ම ෆාතිරස් සමාවාති වල් අර්ලි, ආලිමිල් ගයිබි වෂ්ෂහාදති, රබ්බ කුල්ලි ෂෙයිඉන් වමලීකිහි, අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලා අන්ත, අඋදු බික මින් ෂර්රි නෆ්සී, වමින් ෂර්රිෂ් ෂෙයිතානිහි වෂිර්කිහි, වඅන් අක්තරිෆ අලා නෆ්සී සූඅන් අව් අජුර්රහූ ඉලා මුස්ලිම්" තේරුම: අහස් හා පොළොව මැවූ, සැඟවුන හා නොසැඟවූ සියල්ල දන්නා දෙවිඳුනි! සියලූ දැහි පරමාධිපතියනි! හිමිපාණනි! නැමදුමට සුදුස්සා ඔබ හැර අන් කිසිවෙක් නැති බව මම සාක්ෂි දරමි. මාගේ සිතෙහි ඇති විය හැකි නපුරෙන් ද ෂෙයිතාන්ගෙන් ඇතිවිය හැකි හානියෙන් ද යමක් ආදේශ කිරීමෙන් ද මට විරුද්ධව නපුරක් කිරීමෙන් හෝ මුස්ලිම්වරයෙකුට මා විසින් සිදු කිරීමෙන් ද ආරක්ෂාව මම ඔබෙන් පතමි.

«اللهم إني أصبحت أُشهدُك وأشـــهد حملة عرشك وملائكتك وأنبياءك وجميع خلقك بأنك أنت الله لا إله إلا أنت وأن محمدًا عبدك ورسولك» (أربع مرات)

"අල්ලාහුම්ම ඉන්නී අස්බහ්තු උෂ්හිදුක වඋෂ්හිදු හමිලත අර්ෂික වමලායිකතක වඅන්බියාඅක වජ්මීඅ හැල්කික බිඅන්නක අන්ත අල්ලාහු, ලා ඉලාහ ඉල්ලා අන්ත වඅන්න මුහම්මදන් අබ්දුක වරසූලුක" තේරුම: යා අල්ලාහ්, ඔබ හැර වෙනත් දෙවියකු නැති බවත් මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් ඔබේ ගැත්තා හා දූතයාණන් බවත් මම ඔබ මත සාක්ෂි දරමින් හා ඔබේ අර්ෂය දරා සිටින මලක්වරුන් ඔබේ වක්තෘවරුන් හා ඔබේ සියලුම මැවීම් මත සාක්ෂි දරමින් මම උදෑසනට පිවිසුනෙමි.

«اللهم إني أمسيت...»

"සවස් කාලයේදී "අල්ලාහුම්ම ඉන්නී අස්බහ්තු..." වෙනුවට අල්ලාහුම්ම ඉන්නී අම්සෙයිතු... යනුවෙන් පවසමින්, එහි අවසානය දක්වාම පැවසිය යුතුය. (සිව් වරක්)

«لا إله إلا الله وحـــده لا شريك له. له الملك وله الحمد. وهو على كل شيء قدير»

(مائة مرة) في الصباح أو المساء

"ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහූ ලා ෂරීකලහූ ලහුල් මුල්කු වලහුල් හම්දු වහුව අලා කුල්ලි ෂයිඉන් කදීර්." තේරුම: නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර කිසිවෙක් හෝ කිසිවක් නොමැත. ඔහ ඒකීයය. ඔහුට කිසිදු හවුල්කරුවකු නැත. සියලු ආධිපත්‍යය ඔහු සතුය. සියලු ප්‍රශංසා ද ඔහු සතුය. සියලු දෑ කෙරෙහි ඔහු බලය දරන්නාය" උදේ හා සවස (සිය වාරයක්)

«حسبي الله لا إله إلا هو عليه توكلت وهو رب العرش العظيم» (سبع مرات)

"හස්බියල්ලාහු ලා ඉලාහ ඉල්ලා හුව අලෙයිහි තවක්කල්තු වහු ව රබ්බුල් අර්ෂිල් අළීම්." තේරුම: අල්ලාහ්ම මට ප්‍රමාණවත්ය. නමැදුමට සුදුස්සා ඔහු හැර වෙනත් කිසිවෙක් නැත. (මගේ සියලුම කාර්යයන්) මම ඔහුටම භාර කර, විශ්වාසය තබමි. ඔහු මහා රාජ්‍යයේ පරමාධිපතිය.

(සත් වාරයක්)

«سبحان الله وبحمده» (مائة مرة) في الصباح أو المساء. أو فيهما جميعًا

"සුබ්හානල්ලාහි වබිහම්දිහි" තේරුම: අල්ලාහ් තම ප්‍රශංසාව තුළින් සුවිශුද්ධය. (සිය වාරයක්) උදේ හෝ සවස එසේ නැතිනම් දෙවෙලේම.

«أستغفر الله وأتوب إليه» (مائة مرة)

"අස්තග්ෆිරුල්ලාහ ව අතූබු ඉලෙයිහි" තේරුම: අල්ලාහ්ගෙන් පාප ක්ෂමාව අයැද ඔහු වෙතට යොමු වෙමි. (සිය වාරයක්)

මෙය ලියන ලද පහසු වඳන් පෙළි කිහිපයකි. මෙමගින් ප්‍රයෝජනය ලබන්නට මම සර්වබලධාරී අල්ලාහ්ගෙන් ඉල්ලා සිටිමි.

මුහම්මද් අස්-සාලිහ් අල්-උසෙය්මීන් විසින් ලියන ලද්දකි.
හිජ්රි 20-1-1418

بيان الإسلام
Bayan AL-Islam
تعرف على الإسلام

موسوعة الأحاديث النبوية
HadeethEnc.com
موسوعة تضم ترجمات للأحاديث النبويـــة وشروحها بعدة لغـات

موسوعة القرآن الكريم
QuranEnc.com
موسوعة تضم تفاسير وتراجم مؤلفة لمعاني القرآن الكريم

رقم الإيداع: 1445/22370
Si312-t3

جمعية خدمة المحتوى الإسلامي باللغات
مؤلفات فضيلة الشيخ العلامة محمد بن صالح العثيمين رحمه الله تعالى
بيان الإسلام Bayan AL-Islam

نشر الإسلام بأكثر من 100 لغة

الأذكار التي تقال صباحا ومساء - سنهالي

උදේ සහ සවස කිව යුතු ප්‍රාර්ථනා

මුහම්මද් අස්-සාලිහ් අල්-උසෙය්මීන්

بيان الإسلام Bayan AL-Islam
مؤلفات فضيلة الشيخ العلامة محمد بن صالح العثيمين رحمه الله تعالى
المحتوى الإسلامي



උදේ සහ සවස කිව යුතු ප්‍රාර්ථනා

මුහම්මද් අස්-සාලිහ් අල්-උසෙය්මීන්

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්. (මහා කාරුණික පරම දයාබර අල්ලාහ්ගේ නාමයෙන් ආරම්භ කරමි.)

﴿اللَّهُ لَآ إِلَٰهَ إِلَّا هُوَ ٱلۡحَيُّ ٱلۡقَيُّومُۚ لَا تَأۡخُذُهُۥ سِنَةٞ وَلَا نَوۡمٞۚ لَّهُۥ مَا فِي ٱلسَّمَٰوَٰتِ وَمَا فِي ٱلۡأَرۡضِۗ مَن ذَا ٱلَّذِي يَشۡفَعُ عِندَهُۥٓ إِلَّا بِإِذۡنِهِۦۚ يَعۡلَمُ مَا بَيۡنَ أَيۡدِيهِمۡ وَمَا خَلۡفَهُمۡۖ وَلَا يُحِيطُونَ بِشَيۡءٖ مِّنۡ عِلۡمِهِۦٓ إِلَّا بِمَا شَآءَۚ وَسِعَ كُرۡسِيُّهُ ٱلسَّمَٰوَٰتِ وَٱلۡأَرۡضَۖ وَلَا يَـُٔودُهُۥ حِفۡظُهُمَاۚ وَهُوَ ٱلۡعَلِيُّ ٱلۡعَظِيمُ﴾ البقرة: 255

﴿අල්ලාහු ලාඉලාහ ඉල්ලාහුවල් හයියුල් කයියූම් ලා තඃුදුහු සිනතුව් - වලා නව්මුල්-ලහූ මා ෆිස්-සමාවාති වමා ෆිල්-අර්ලිළි මන් දල්ලදී යෂ්ෆඋ ඉන්දහු ඉල්ලා බි ඉද්නිහි යඃලමු මා බයින අයිදීහිම් වමා කඃල්ෆහුම් වලා යුහීතූන බිෂෙයිඉන් මින් ඉල්මිහි ඉල්ලා බිමාෂා-අ වසිඅ කුර්සියියුහුස් සමාවාති වල්-අර්ළ වලා යඋදුහු හිෆ්ලුහුමා වහුවල් අලියියුල් අළීම්. තේරුම: අල්ලාහ් වනාහි ඔහු හැර වෙනත් දෙවියෙක් නොමැත. සදා ජීවමාන ය, සදා පැවැත්ම ඇත්තා ය. මද නින්ද හෝ (තද) නින්ද හෝ ඔහු ව ග්‍රහණය නොකරයි. අහස් හි ඇති දෑ ද මහපොළොවේ ඇති දෑ ද ඔහු සතු ය. ඔහුගේ අනුමැතියෙන් මිස ඔහු අබියස මැදිහත් වන්නෙකු විය හැක්කේ කවරෙකුට ද? ඔවුනට ඉදිරියේ ඇති දෑ ද ඔවුනට පසුපසින් ඇති දෑ ද ඔහු දන්නේය. ඔහු අභිමත කළ පරිදි මිස ඔහුගේ දැනුමෙන් කිසිවක් ඔවුහු ග්‍රහණය නොකරති. ඔහුගේ අසුන අහස් හි හා මහපොළොවෙහි ව්‍යාප්ත ව ඇත. ඒ දෙක ආරක්ෂා කිරීම ඔහුට දුෂ්කර නොවේ. තව ද ඔහු අති උත්තරීතර ය. සර්ව බලධාරී ය.﴾ "ආයතුල් කුරුසි: අල්-බකරා 255."

﴿ءَامَنَ ٱلرَّسُولُ بِمَآ أُنزِلَ إِلَيۡهِ مِن رَّبِّهِۦ وَٱلۡمُؤۡمِنُونَۚ كُلٌّ ءَامَنَ بِٱللَّهِ وَمَلَٰٓئِكَتِهِۦ وَكُتُبِهِۦ وَرُسُلِهِۦ لَا نُفَرِّقُ بَيۡنَ أَحَدٖ مِّن رُّسُلِهِۦۚ وَقَالُواْ سَمِعۡنَا وَأَطَعۡنَاۖ غُفۡرَانَكَ رَبَّنَا وَإِلَيۡكَ ٱلۡمَصِيرُ﴾

﴿ආමනර් රසූලු බිමා උන්සිල ඉලෙයිහි මිර්-රබ්බිහි වල්-මුඃමිනූන්, කුල්ලුන් ආමන බිල්ලාහි වමලාඉකතිහි වකුතුබිහි වරුසුලිහි ලා නුෆර්රිකු බයින අහදිම් මිර් රුසුලිහි, වකාලූ සමිඃනා වඅතඃනා ගුෆ්රානක රබ්බනා වඉලයිකල් මසීර්" තේරුම: තම පරමාධිපතිගෙන් තමන් වෙත පහළ කරනු ලැබූ දෑ පිළිබඳ ව ධර්ම දූතයා විශ්වාස කළේය. විශ්වාස කළවුන් ද (විශ්වාස කළෝය.) සියල්ලෝම අල්ලාහ්ව ද ඔහුගේ දේව ග්‍රන්ථ ද ඔහුගේ ධර්ම දූතයින්ව ද විශ්වාස කළෝය. ඔහුගේ ධර්ම දූතයින් අතුරින් කිසිවෙකු අතර හෝ අපි වෙනස්කම් ඇති නොකරන්නෙමු. තවද අපි සවන් දුනිමු. අවනත වූයෙමු අපගේ පරමාධිපතියාණෙනි, ඔබෙන් සමාව පතන්නෙමු. තවද යොමු වන ස්ථානය ඇත්තේ ඔබ වෙතය යැයි ඔවුහු පැවසුවෝය.*﴾

﴿لَا يُكَلِّفُ ٱللَّهُ نَفۡسًا إِلَّا وُسۡعَهَاۚ لَهَا مَا كَسَبَتۡ وَعَلَيۡهَا مَا ٱكۡتَسَبَتۡۗ رَبَّنَا لَا تُؤَاخِذۡنَآ إِن نَّسِينَآ أَوۡ أَخۡطَأۡنَاۚ رَبَّنَا وَلَا تَحۡمِلۡ عَلَيۡنَآ إِصۡرٗا كَمَا حَمَلۡتَهُۥ عَلَى ٱلَّذِينَ مِن قَبۡلِنَاۚ رَبَّنَا وَلَا تُحَمِّلۡنَا مَا لَا طَاقَةَ لَنَا بِهِۦۖ وَٱعۡفُ عَنَّا وَٱغۡفِرۡ لَنَا وَٱرۡحَمۡنَآۚ أَنتَ مَوۡلَىٰنَا فَٱنصُرۡنَا عَلَى ٱلۡقَوۡمِ ٱلۡكَٰفِرِينَ﴾ البقرة: 285-286.

﴿ලා යුකල්ලිෆුල්ලාහු නෆ්සන් ඉල්ලා වුස්අහා ලහා මා කසබත් වඅලයිහා මක්තසබත් රබ්බනා ලා තුආකිඃද්නා ඉන් නසීනා අව් අක්තඃනා රබ්බනා වලා තහ්මිල් අලයිනා ඉස්රන් කමා හමල්තහූ අලල්ලදීන මින් කබ්ලිනා රබ්බනා වලා තුහම්මිල්නා මා ලා තාකත ලනා බිහි වඃපු අන්නා වග්ෆිර්ලනා වර්හමනා අන්ත මව්ලානා ෆන්සුර්නා අලල් කව්මිල් කාෆිරීන්"
තේරුම: අල්ලාහ් කිසිදු ආත්මයකට එහි හැකියාව අනුව මිස වෙනත් කිසිවක් පවරන්නේ නැත. එය ඉපැයූ දෑ එයටය. එයට එරෙහිව ඉපැයූ දෑ ද එයටය. අපගේ පරමාධිපතියාණනි! අප (යමක්) අමතක කළේ නම් හෝ අප වරදක් කළේ නම් හෝ අපව දඬුවමට ග්‍රහණය නොකරනු මැනව! තවද අපට පෙර සිටියවුන් මත කවර දෙයක් ඔබ උසුලන්නට සැලැස්වූයේ ද එවැනි බරක් උසුලන්නට නොසලස්වනු මැනව! කවර දෙයක් අපට සිදු කිරීමට ශක්තිය නොමැත්තේ ද එවැන්නක් අප මත නොපටවනු මැනව! (අප කළ වැරදි) අපගෙන් නොසලකා හරිනු මැනව! තවද අපට සමාව දෙනු මැනව! තවද අපට කරුණා කරනු මැනව! ඔබ අපගේ භාරකරුය. එබැවින් දේව ප්‍රතික්ෂේපිත පිරිසට එරෙහි ව අපට උදව් කරනු මැනව! ﴾
අල්-බකරා: 285, 286.

﴿قُلۡ هُوَ ٱللَّهُ أَحَدٌ ۝١﴾ الإخلاص: 1.

﴿කුල් හුවල්ලාහු අහද් පරිච්ඡේදය﴾ (සූරා අල්-ඉක්ලාස්)

﴿قُلۡ أَعُوذُ بِرَبِّ ٱلۡفَلَقِ ۝١﴾ الفلق: 1.

﴿කුල් අඋදු බිරබ්බිල් ෆලක් පරිච්ඡේදය﴾ (සූරා අල් ෆලක්)

﴿قُلۡ أَعُوذُ بِرَبِّ ٱلنَّاسِ ۝١﴾ الناس: 1.

﴿කුල් අඋදු බිරබ්බින් නාස්﴾ (සූරා අන්-නාස්)

ඉහත සඳහන් සූරා තුන සම්පූර්ණයෙන්ම තුන් වරක්

පාරායනය කරන්න

«أعوذ بكلمات الله التامات من شر ما خلق» (තුන් වරක්)

"අඋදු බිකලිමාතිල්ලාහිත් තාම්මාති මින් ෂර්රි මා හෑලක්"

තේරුම: අල්ලාහ්ගේ පරිපූර්ණ වූ වදන් තුළින්, ඔහුගේ මැවීම්වලින් සිදුවිය හැකි හානියෙන් ආරක්ෂාව පතමි. (තුන් වරක්)

«بِسْمِ اللهِ الَّذِي لاَ يَضُرُّ مَعَ اسْمِهِ شَيْءٌ فِي الأَرْضِ وَلاَ فِي السَّمَاءِ وَهُوَ السَّمِيعُ الْعَلِيمُ» (තුන් වරක්)

"බිස්මිල්ලාහිල්ලදී ලා යළ්රු මඅස්මිහි ෂෙය්ඉන් ෆිල් අර්ලි වලා ෆිස් සමාඉ වහුවස් සමීඋල් අලීම්" තේරුම: අහස් හා පොළොව තුළ ඔහුගේ නාමය සමග කිසිම වස්තුවකට ගැටිය නොහැකි (අනතුරක් කළ නොහැකි) වූ අල්ලාහ්ගේ නාමයෙන් ආරක්ෂාව පතමි. ඔහු සියල්ල අසා සිටින්නාය. සර්වඥය.(තුන් වරක්)

«رضيت بالله ربًّا وبالإسلام دينًا وبمحمد صلى الله عليه وسلم نبيًّا» (තුන් වරක්)

"රළීතු බිල්ලාහි රබ්බන්, වබිල් ඉස්ලාමි දීනන්, වබි මුහම්මදින් සල්ලල්ලාහුලෙයිහි වසල්ලම නබියියන්" තේරුම: අල්ලාහ්ව පරමාධිපති ලෙසත් ඉස්ලාමය ආගම ලෙසත් මුහම්මද් තුමා වක්තෘවරයාණන් ලෙසත් මම පිළිගනිමි. (තුන් වරක්)

«أصبحنا وأصبح الملك لله والحمد لله لا إله إلا الله وحدة لا شريك له. له الملك وله الحمد وهو على كل شيء قدير. رب أسألك خير ما فى هذا اليوم وخير ما بعده. وأعوذ بك من شر ما فى هذا اليوم ومن شر ما بعده. ربِّ أعوذ بك من الكسل والهرم وسوء الكِبَر. وأعوذ بك من عذاب النار وعذاب القبر»

"අස්බහ්නා වඅස්බහල් මුල්කු ලිල්ලාහ්, වල්හම්දු ලිල්ලාහ්, ලා ඉලාහ ඉල්ලල්ලාහු, වහ්දහූ ලා ෂරීක ලහූ, ලහුල් මුල්කු වලහුල් හම්දු, වහුව අලා කුල්ලි ෂෙයිඉන් කදීර්, රබ්බි අස් අලූක හෑයර මා ෆි හාදල් යව්මි වහෑයර මා බඃදා, වඅූඋදු බික මින් ෂර්රි මා ෆී හාදල් යව්මි වමින් ෂර්රි මා බඃදූ, රබ්බි අූඋදුබික මිනල් කස්ලි, වල් හරමි, වසූඉල් කිබර්, වඅූඋදු බික මින් අදාබින් නාරි වඅදාබිල් කබ්රි" තේරුම: අපි උදේ කාලයට උදාවුනෙමු. පාලනය කිරීමේ ශක්තිය අල්ලාහ්ටම හිමි වේ. සියලු ප්‍රශංසා අල්ලාහ් සතුය. නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙක් නැත. ඔහු එකීයය. අසමසමය. පාලනය ඔහු සතුය. සියලු ප්‍රශංසා ඔහුටමය. ඔහු සියලු දේ කෙරෙහි තම බලය පවත්වයි. මගේ පරමාධිපතියාණනි! අද දවසේ හා අදින් පසු සිදුවිය හැකි යහපත මම ඔබෙන් පතමි. තවද අද දවසේ හා අදින් පසුව සිදුවිය හැකි හානියෙන් ආරක්ෂාව මම ඔබෙන් පතමි. මාගේ පරමාධිපතියාණනි! උදාසීනත්වය හා මහළු වයෝවෘද්ධ භාවයෙන් (වියහැකි හානිවලින්) ආරක්ෂාව පතමි. මගේ පරමාධිපතියාණනි, අපා ගින්නේ හා කබරයේ වේදනාවෙන් මම ආරක්ෂාව පතමි."

«أمسينا وأمسى الملك لله»

"සවස් කාලයේ මෙසේ පවසයි: "අම්සයිනා වඅම්සල් මුල්කු ලිල්ලාහ්..." තේරුම: අපි සැන්දෑ කාලයට පැමිණියෙමු. පාලන බලතල අල්ලාහ්ටම හිමිය. තව දුරටත් මෙසේ පවසයි. "රබ්බි අස් අලූක හෑයර මා ෆි හාදිහිල් ලෙය්ලති..." තේරුම: අහෝ පරමාධිපතියාණනි! මේ රාත්‍රියේ ඇති යහපත මම ඔබෙන් පතමි. (ඉහත සඳහන්ව වාක්‍යය්) අවසානය දක්වාම අනුගමනය කෙරෙයි. එය "අස්බහ්නා වඅස්බහ" යන ප්‍රකාශය හා "හාදල් යව්ම" යන ප්‍රකාශය වෙනුවටය."

«اللهم بك أصبحنا وبك أمسينا وبك نحيا وبك نموت واليك النشور»

"අල්ලාහුම්ම බික අස්බහ්නා වබික අම්සයිනා වබික නහ්යා වබික නමූතු වඉලෙයිකන් නුෂූර්" තේරුම: යා අල්ලාහ් ඔබ තුළින්ම අපි උදෑසනට පිවිසියෙමු. එලෙසම සවස් කාලයටද පිවිසෙන්නෙමු. ඔබ නිසාම ජීවත්ව සිටින්නෙමු. ඔබ නිසාම මරණයට පත්වන්නෙමු. (මරණයෙන් පසු) නැවත රැස්කරනු ලබනුයේ ඔබ වෙතටමය.

«اللهم بك أمسينا وبك أصبحنا وبك نموت وبك نحيا وإليك المصير»

සවස් කාලයේ මෙසේ පවසයි: "අල්ලාහුම්ම බික අම්සයිනා වබික අස්බහ්නා වබික නහ්යා වබික නමූතු වඉලෙයිකල් මසීර්." තේරුම: යා අල්ලාහ් ඔබ තුළින්ම අපි සන්ධ්‍යා කාලයට පිවිසියෙමු. ඔබ නිසාම උදෑසනට පිවිසියෙමු. ඔබ නිසාම ජීවත්ව සිටින්නෙමු. ඔබ නිසාම මරණයට පත්වන්නෙමු. (මරණයෙන් පසු) නැවත පැමිණෙන්නේ ඔබ වෙතටමය.

«اللهم ما أصبح بى من نعمة أو بأحد من خلقك فمنك وحدك لا شريك لك فلك الحمد ولك الشكر»

"අල්ලාහුම්ම මා අස්බහ බී මින් නිඃමතින් අව් බිඅහදින් මින් හෑල්කික ෆමින්ක වහ්දක ලා ෂරීක ලක ෆලකල් හම්දු වලකෂ් ෂුක්රු" තේරුම: යා අල්ලාහ් මට හෝ ඔබ මැවූ ඕනෑම ජීවියකුට හිමිදිරි උදෑසන පහළ වන යම් ආශීර්වාදයක් ඇත්නම් එය ඔබ වෙතින්ය. ඔබ ඒකීයය. තවද කිසිදු හවුල්කරුවකු ඔබට නැත. ප්‍රශංසා සියල්ල ඔබ සතුය. සියලු කෘතඥතා ඔබටම හිමිය.

«ما أمسى بى ...»

සවස් කාලයේ මා අස්බහ බී වෙනුවට: "...මා අම්සා බී..." යැයි පවසයි.

«اللهم إنى أســألك العافية فى الدنيا والآخرة. اللهم إنى أسألك العفو والعافية فى دينى ودنياى وأهلى ومالى. اللهم اســتر عوراتى وآمن روعاتى. اللهم احفظنى من بين يدىّ ومن خلفى وعن يمينى وعن شمالى ومن فوق. وأعوذ بعظمتك أن أُغتال من تحتى»

"අල්ලාහුම්ම ඉන්නී අස්අලුකල් ආෆියත ෆිද් දුන්යා වල්-ආහිරා, අල්ලාහුම්ම ඉන්නී අස්අලුකල් අෆ්ව වල් ආෆියත ෆි දීනි වදුන්යාය වඅහ්ලි වමාලී, අල්ලාහුම්මස්තුර් අව්රාති වආමින් රව්ආති අල්ලාහුම්ම අහ් ෆල්නි මින් බයිනි යදයිය' වමින් හැල්ෆි වඅන් යමීනි. වඅන් ෂිමාලි වමින් ෆවිකී, ව අූඋදු බි අළමතික අන් උෆාල මින් තහ්තී" තේරුම: අහෝ දෙවිඳුනි! මොලොව හා මතුලොව සුවය මම ඔබෙන් පතමි. අහෝ දෙවිඳුනි! මගේ ආගම, මගේ මෙලොව ජීවිතය, මගේ පවුල හා මගේ සැප සම්පත්වල යහපත ද මම ඔබෙන් පතමි. අහෝ දෙවිඳුනි! මගේ අඩුපාඩු වසන් කරනු මැනව.